# ඊළඟ මැතිවරණයට කලින් ව්‍යවස්ථාදායක සභාව ඕනෑ

## පැෆ්රල් සංවිධානය රජයෙන් ඉල්ලයි

ගයාලු ගීතනආරච්චි

ඉදිරියේදී පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයට පෙර ව්‍යවස්ථාදායක සභාව ස්ථාපිත කරන ලෙස පැෆ්රල් සංවිධානය රජයෙන් ඉල්ලීමක් කරයි.

ඉන් අනතුරුව මැතිවරණ කොමිසම, පොලිස් කොමිසම හා රාජ්‍ය සේවා කොමිසම වැනි නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට සෘජුවම අදාළ වන ආයතන ව්‍යුහයන් ස්ථාපිත කිරීමට මැදිහත් වන ලෙස අග්‍රාමාත්‍යවරයාගෙන් සහ විපක්ෂ නායකවරයාගෙන් ඉල්ලා සිටින බවද පැෆ්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පැවැසීය.

පාර්ලිමේන්තු මැතිවරණයක් පිළිබඳව සමාජය තුළ සංවාදයක් නිර්මාණය වී ඇති වටපිටාවක එම මැතිවරණයේ සුජාත භාවය වෙනුවෙන් මෙම කොමිෂන් සභා ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය සාධකයක් බවද හෙතෙම පෙන්වා දුන්නේය.